Business & Accounting Studies Business & Accounting Studies

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2019 ජූලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 செப்டம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2019

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
**Business and Accounting Studies I, II**

පැය තුනයි
*Three hours*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුය :
- (i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- (ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- (iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය මත (x) ලකුණ යොදන්න.
- (iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැළකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

01. ව්‍යාපාර බිහිවීමට ප්‍රධාන පදනම සැලසී ඇත්තේ,
01. උපකාරක සේවා 02. භාණ්ඩ හා සේවා 03. ලාභය හා තෘප්තිය 04. අවශ්‍යතා හා වුවමනා

02. ව්‍යාපාරයක විවිධ අරමුණු පවතී. ඒ අතුරින් ව්‍යාපාරයක අරමුණක් නොවන්නේ,
01. සමාජ සේවා සුබ සාධනය 02. සේවක ආදායම උපරිම කිරීම
03. රැකියා උත්පාදනය 04. අයිතිකරුවන්ගේ පෞද්ගලික තෘප්තිය

03. අවශ්‍යතා පොදු හා සීමිත වේ. වුවමනා,
01. ගණනය කළ නොහැක. 02. විවිධ හා සරල වේ. 03. අසීමිත වේ. 04. විවිධ හා අසීමිත වේ.

04. නිෂ්පාදක සාධක ලෙස සලකනුයේ,
01. ශ්‍රමය, ප්‍රාග්ධනය, නව්‍යතා, අවදානම්. 02. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, නව්‍යතා
03. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය 04. භූමිය, ප්‍රාග්ධනය, වැටුප, අවදානම්

05. පහත දැක්වෙනුයේ ව්‍යාපාර පරිසරය අධ්‍යනයෙන් හඳුනාගත හැකි ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන කිහිපයකි.
1. බදු සහන බදු විරාම 2. පුහුණු සේවකයෝ 3. සුවිශේෂී නිෂ්පාදන ක්‍රම 4. ස්වාභාවික ආපදා
5. අධිවේගී මාර්ග 6. තරගකාරීත්වය 7. පිළිගත සන්නම් නාමය 8. යහපත් භූගෝලීය පිහිටීම

ඉහත දෑ අතරින් ශක්තීන් A කාණ්ඩයේ අවස්ථා B කාණ්ඩයේත් නිවැරදිව දක්වා ඇත්තේ,
01. A - 1, 2, 5 B - 3, 6, 8 02. A - 2, 3, 7 B - 1, 5, 8 03. A - 3, 7, 8 B - 1, 6, 8 04. A - 2, 7, 1 B - 4, 6, 5

06. පහත සංවිධාන අතරින් ලාභ අරමුණු කර නොගත් පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානය වනුයේ,
01. රාජ්‍ය සමාගම් 02. හවුල් ව්‍යාපාර 03. දෙපාර්තමේන්තු 04. සමුපකාර සමිති


07. හවුල් ව්‍යාපාරයක සිටිය යුතු උපරිම සාමාජික සංඛ්‍යාව සඳහන් වන පණත වනුයේ,
01. 2007 අංක 7 දරණ සමාගම් පණත 02. 1890 හවුල් ආඥා පණත
03. 1840 වංචා වැළැක්වීමේ ආඥා පණත 04. 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පණත

08. රාජ්‍ය සංස්ථා ආරම්භ කළ යුත්තේ,
01. පොදු පණතක් යටතේ ය. 02. විශේෂ හෝ පොදු පාර්ලිමේන්තු පණතක් යටතේ ය.
03. අතුරු අයවැයක් මගින් ය. 04. 2007 අංක 7 දරණ සමාගම් පණත යටතේ ය.

09. ව්‍යාපාර නාම ආඥා පණත අදාල වන්නේ,
01. තනි පුද්ගල ව්‍යාපාර වලට පමණි. 02. තනි හා හවුල් ව්‍යාපාර වලට පමණි.
03. හවුල් ව්‍යාපාර වලට පමණි 04. සමාගම් වලට පමණි.

10. විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග කිහිපයක් පහත වේ.
A - තේවල ස්වාමි ව්‍යාපාර B - හවුල් ව්‍යාපාර C - සීමිත පොදු සමාගම් D - සීමිත පෞද්ගලික සමාගම්
ලාභ ලැබීම අරමුණ වුවද පෞද්ගලික අංශයට අයත් නීතිමය පුද්ගලභාවයක් නොමැති ව්‍යාපාර සංවිධාන වන්නේ,
01. A, B 02. A, C 03. A, D 04. C, D

11. A B C D




ඉහත රේඛණ අතුරින් විශේෂ රේඛණයක් වනුයේ,
01. A, B හා D 02. A හා B 03. D පමණි. 04. ඉහත සියල්ල ම

12. A - ස්වාමියා හා භාර්යාව අතර එකිනෙකාගේ ජීවිත පිළිබඳ ව
B - දෙමාපියන් හා දරුවන් අතර ඇති රක්ෂ්‍ය හිමිකම
C - දේපලවල නීත්‍යානුකූල අයිතිකරුට දේපලවල ඇති හිමිකම
D - උකස් භාණ්ඩ ගැණුම්කරුට උකසට ගත් භාණ්ඩ සඳහා ඇති අයිතිය

ඉහත සිද්ධීන් ඇසුරෙන් රක්ෂ්‍ය හිමිකමට පටහැනි වුයේ,
01. B පමණි. 02. B හා D පමණි. 03. A හා C 04. ඉහත කිසිවක් නොවේ.

13. පහත දැක්වෙන සනනිවේදන ස්වරූප හා මාධ්‍ය නිදසුන් පෙරදැරිව ගලපා ඇති පිළිතුර වනුයේ,

| P | Q |
|---|---|
| A - වාචික | 1. සීනුව, මාර්ග, සංඥා. |
| B - ලිඛිත | 2. දුරකථන සංවාද |
| C - විද්‍යුත් | 3. ලිපි, දැන්වීම් |
| D - සංකේත හා සංඥා | 4. වෙබ් අඩවි, ශබ්දවාහිනී යන්ත්‍ර |

01. A2, B3, C4, D1 02. A3, B2, C4, D1 03. A2, B4, C3, D1 04. A2, B3, C1, D4

14. සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග හා සුදුසු සන්නිවේදන මාධ්‍යයක් තෝරා ගැනීමේ දි සැලකිලිමත් විය යුතු කරුණු පහත වේ.
A. මාධ්‍ය B. පිරිවැය C. පණිවිඩය D. වේගය
E. ප්‍රතිචාරය F. පහසුව

ඒ අතුරින් සන්නිවේදනයේ මූලිකාංග වනුයේ,
01. A, D, E 02. B, E, F 03. B, C, F 04. A, B, E

15. කළමණාකරණ ක්‍රියාවලියට අයත් කාර්යයක් වන සංවිධානකරණය ලෙස හඳුන්වනුයේ,
01. ව්‍යාපාරයේ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය සම්පත්, තනතුරු හා වැඩ බෙදාහැරීමේ ක්‍රියාවලියයි.
02. සම්පත් සඵලදායීව හා කාර්යක්ෂමව යෙදීම.
03. අවශ්‍ය සම්පත් හා සේවකයන් තීරණය කිරීම
04. ඉහත කිසිවක් නොවේ.

16. අළෙවි මිශ්‍රය හා ඊට අදාල විචලනයන් පහත වේ.

| අළෙවි මිශ්‍රය (P) | විචල්‍යයන් (Q) |
|---|---|
| A - මිල | 1 - විකුණුම් ප්‍රවර්ධනය |
| B - නිෂ්පාදිතය | 2 - දීමනා |
| C - ස්ථානය | 3 - ආවරණ ප්‍රදේශ |
| D - ප්‍රවර්ධනය | 4 - ඇසුරුම |

ඉහත P හි දැක්වෙන මිශ්‍රයන්ට අදාල Q හි දැක්වෙන විචලනයන් නිවැරදිව ගලපා ඇති පිළිතුර වනුයේ,
01. A1, B2, C4, D3 02. A2, B3, C1, D4 03. A2, B4, C3, D1 04. A1, B2, C3, D4

17. ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වනුයේ,
01. කළමණාකරුවන්ට අවශය තොරතුරු ලබා දීම
02.ඇල්මැති පාර්ශවයන්ට තීරණ ගැනීමට අවශය තොරතුරු ලබා දීම.
03. ව්‍යාපාරයේ ලාභය දැන ගැනිම
04. පිරිවැය හා මූල්‍ය පාලනය.

18. පහත දැක්වෙනුයේ ගිණුම්කරණ මූලිකාංගවල නිර්ණායක හා ලක්‍ෂණ කිහිපයකි.
A - පිරිවැය හෝ අගය විශ්වාසදායි ලෙස මැනිය හැකි විම.
B - අතීත ගනුදෙනුවක හා සිදුවිමක ප්‍රතිඵලයක් විම
C - වර්තමානයේ ව්‍යාපාරය සතු බැඳීමකි.
D - අනාගතයේ ව්‍යාපාරය තුළට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ නම්‍යතාවයක් තිබිම.

ඉහත දෑ අතරින් වත්කමකට අදාල නිර්ණායක වනුයේ,
01. A හා D 02. A, B හා D 03. A පමණි. 04. ඉහත සියල්ල ම.

19. පහත දැක්වෙනුයේ ගිණුම් වර්ග කිහිපයකි. ඒ අතුරින් වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ගිණුම් පිළිවෙළට ඇතුළත් වනුයේ,
01. තොගය, ණය පොළී, විකුණුම්, ලැබිය යුතු පොළී.
02. ලැබිය යුතු ණය පොළී, කලින් ලද ගෙවල් කුලි, ලද පොළී, ණය පොළී
03. ලද පොළී, කලින් ගෙවු ගෙවල් කුලි, ණය පොළී, විදුලිය
04. තොගය, බැංකු ණය, කලින් ලද ගෙවල් කුලි, රක්‍ෂණය

20. අයිතිකරුගේ හිමිකම වෙනස් විමට බලනොපාන ගනුදෙනුව වනුයේ,
01. ආදායම්, වියදම් 02. අමතර ප්‍රාග්ධනය, ගැනිලි
03. වත්කම් ගැනිම, වගකීම් 04. ආදායම්, අමතර ප්‍රාග්ධනය

21. ලක්දිව ලී බඩු සමාගම ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 150,000ක් වටිනා කාර්යාල ලී බඩු ද අලෙවි කිරිම සඳහා රු. 300,000 ක් වටිනා ලී බඩු උපකරණ ද, දිව්සර සමාගමෙන් ණයට ගන්නා ලදි. ලී බඩු උපකරණ රු. 40.000 ක් ඒදින අත්පිට මුදලට විකුණන ලදි. ඉහත ගනුදෙනු වාර්තා කිරිමට අදාල මූලික පොත් පිළිවෙලින් දැක්වෙනුයේ,
01. පොදු ජ්නලය, ගැණුම් ජ්නලය, මුදල් පොත. 02. පොදු ජ්නලය, විකුණුම් ජ්නලය, ගැණුම් ජ්නලය
03. ගැනුම් ජ්නලය, ගැණුම් ජ්නලය, මුදල් පොත 04. පොදු ජ්නලය, විකුණුම් ජ්නලය, විකුණුම් ජ්නලය

22. ව්‍යාපාරයක සිහිවටන තීරු ලෙස සැලකෙනුයේ,
01. ලද වට්ටම්, දුන් වට්ටම් 02. වෙළෙද වට්ටම්
03. වෙළෙද වට්ටම්, මුදල් වට්ටම් 04. වෙළෙද වට්ටම්, දුන් වට්ටම්, ලද වට්ටම්

❖ චමල් විසින් ලාහිරු සමාගමෙන් රු 200,000 ක ලකුණු කල මිල සහිත භාණ්ඩ ණයට ගන්නා ලදි.වෙළෙද වට්ටම 10% කි. මෙම ණය මුදල 2019.07.31 ට පෙර පියවුවහොත් 5% ක මුදල් වට්ටමක් දෙන බවට ලාහිරු සමාගම පෙරොන්දු විය. චමල් විසින් 2019.07.25 වන දින සම්පූර්ණ මුදල පියවුයේ නම්,

23. චමල් විසින් ගෙවු මුදල කීය ද?
01. රු. 190,000 02. රු. 180,000 03. රු. 171,000 04. ඉහත කිසිවක් නොවේ.

24. ඊට අදාලව චමල්ගේ පොත් වල තැබිය යුතු ද්විත්ව සටහන කුමක් ද?

01.
| | | |
|---|---|---|
| ණයහිමි ගිණුම | හර | රු.180,000 |
| ලද වට්ටම් ගිණුම | බැර | රු. 9,000 |
| මුදල් ගිණුම | බැර | රු. 171,000 |

02.
| | | |
|---|---|---|
| ණයගැති ගිණුම | හර | රු. 200,000 |
| දුන් වට්ටම් | බැර | රු. 10,000 |
| ලද වට්ටම් | බැර | රු. 190,000 |

03.
| | | |
|---|---|---|
| ණයහිමි ගිණුම | හර | රු. 200,000 |
| ලද වට්ටම් ගිණුම | බැර | රු. 20,000 |
| මුදල් ගිණුම | බැර | රු. 180,000 |

04.
| | | |
|---|---|---|
| ණයහිමි ගිණුම | හර | රු. 180,000 |
| ලද වට්ටම් | බැර | රු. 18,000 |
| මුදල් ගිණුම | බැර | රු. 162,000 |

25. උදාරගේ ව්‍යාපාරයේ 2018.01.31 දින සුළු මුදල් භාරකරු සතු ඉතිරිව තිබු මුදල රු. 550 කි. 2018 ජනවාරි මාසයේ සුළු මුදල් වියදම රු. 450 ක් වු බව සුළු මුදල් භාරකරු පවසයි. මෙම ව්‍යාපාරයේ සුළු මුදල් අග්‍රිමය හා ප්‍රතිපූරණ අගය පිළිවෙලින් දැක්වෙනුයේ,

01. රු. 1,000 හා රු.550 2. රු. 450 හා රු. 550 3. රු. 1,000 හා රු. 450 4. රු. 450 හා රු. 1,550

26. පහත ගනුදෙනු අතරින් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය බැංකු ප්‍රකාශයේ ශේෂයට වඩා වැඩි වනුයේ,

01. සෘජු ප්‍රේෂණ, බැංකු ගාස්තු, චෙක්පොත් ගාස්තු
02. ස්ථාවර නියෝග ලැබීම්, තැන්පත් කළ මුත් උපලබ්ධි නොවු චෙක්
03. නිකුත් කළ මුත් ගෙවීමට ඉදිරිපත් නොවු චෙක් හා තැන්පත් කළ මුත් උපලබ්ධි නොවු චෙක්පත්
04. බැංකු ගාස්තු, චෙක්පොත් ගාස්තු ස්ථාවර නියෝග ගෙවීම්

27. 2018.03.31 දිනට ව්‍යාපාරයේ මුදල් පොතට අනුව ශේෂය රු. 25,000කි. ඒ නමුත් එදිනට බැංකු ශේෂයට අනුව ශේෂය රු. 26,000 කි. මෙම ශේෂයයන්ගේ වෙනසට හේතු විය හැකි ගනුදෙනුව වනුයේ,

01. සෘජු ප්‍රේෂණ රු. 1,000 මුදල් පොතේ සටහන් නොවිම
02. තැන්පත් කළ නුමත් උපලබ්ධි නොවු චෙක්පත් රු. 1,000 කි.
03. බැංකුව වැරදිමකින් රු. 1,000ක් බැංකු ගිණුමට හර කිරිම
04. ව්‍යාපාරය වැරදීමකින් මුදල් පොතේ හර කළ වටිනාකම රු. 1,000 කි.

28. ගිණුම්කරණයේ දී සිදුවිය හැකි වැරදි කිහිපයක් පහත වේ.

P - විකුණුම් රු. 5,000 එම ගිණුමට හා ණයගැති ගිණුමට හර කිරිම
Q - ණයට ගැණුම් රු. 1,000 ලී බඩු ගිණුමට හර කර ණයහිමි ගිණුමට බැර කිරිම
R - විකුණුම් ජනලයේ එකතුව රු. 500කින් වැඩි විම

ඉහත වැරදි අතරින් ශේෂ පිරික්සුම අසමාන වීමට බලපානුයේ කුමන වැරදි ද?

01. P හා Q පමණී 02. Q හා R වේ. 03. P පමණි. 04. P, Q හා R යන සියල්ලම

29. පහත දැක්වෙනුයේ ගිණුම්කරණ වැරදි කිහිපයකි.

A - ණයගැතියන්ගෙන් මුදල් ලැබීම් රු. 500 ගිණුම්වල රු. 5,000ක් ලෙස සටහන් විම.
B - ලද ගෙවල්කුලී ගිණුමේ ශේෂය රු. 15,000 ශේෂ පිරික්සුමේ හරට සටහන් කිරිම
C - රු. 1,000 ක විදුලිය ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට පිටපත් නොවිම
D - බැංකු ණය ගෙවිම රු .3,000 මුදල් පොතේ සටහන් නොවිම

ඉහත වැරදි නිවැරදි කිරිමට පෙර ශේෂ පිරික්සුමේ ශේෂය වනුයේ,

01. රු. 32,000 02. රු. 27,000 03. රු. 27,500 04. රු. 17,000

30. ගනුදෙනුවක් ගිණුම්කරණ සමීකරණයට බලපාන අයුරු පහත දැක්වේ.

| **වත්කම්** | = | **වගකීම්** | + | **හිමිකම්** |
|---|---|---|---|---|
| - 15,000 | | | | - 15,000 |

01. රු. 15,000ක බඩු තොග ණයට ගැනීම
02. රු. 15,000ක බැංකු ණය පොලිය ගෙවිම
03. රු. 15,000ක අමතර ප්‍රාග්ධනය යෙදවිම
04. රු. 15,000ක බැංකු ණය ගෙවිම.

31. පහත දැක්වෙන්නේ වෙළෙඳ ව්‍යාපාරයක ගනුදෙනුවකි.

❖ රු. 15,000ක බඩුතොග සුපුන්ට ණයට විකිණිම

මෙම ගනුදෙනුව සටහන් කිරිමට අදාල ද්විත්ව සටහන වනුයේ,

01. මුදල් ගිණුම හර රු 15,000
විකුණුම් ගිණුම බැර රු. 15,000

02. සුපුන් ගිණුම හර රු. 15,000
විකුණුම් ගිණුම බැර රු. 15,000

03. මුදල් ගිණුම හර රු 10,000
සුපුන් ගිණුම බැර රු. 10,000

04. සුපුන් ගිණුම හර රු. 15,000
මුදල් ගිණුම බැර රු. 15,000

32. මෝටර් රථයක් රු. 660,000කට ණයට ගැනිම, ගැණුම් ගිණුමේ සටහන් කිරිම තුළින්,

01. ශේෂ පිරික්සුම සමාන වේ. 02. ශේෂ පිරික්සුම අසමාන වේ.
03. ජංගම නොවන වත්කම්වල අගය වැඩිවේ 04. ව්‍යාපාරයේ ණයහිමි ශේෂය අඩු වේ.

❖ පහත දැක්වෙන තොරතුරු උපයෝගි කරගෙන අංක 33 සිට 40 තෙක් ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

සුමුදුගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනට පිළියෙළ කළ ශේෂ පිරික්සුමෙන් උපුටා ගත් ශේෂ කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| ප්‍රාග්ධනය | රු. 150,000 |
| තොගය (2018.01.01) | රු. 24,600 |
| ගෙනඒමේ කුලි | රු. 3,800 |
| බැංකු අයිරාව | රු. 7,600 |
| ණයගැතියෝ | රු. 9,100 |
| විදුලිය | රු. 14,500 |
| ගැණුම් | රු. 72,300 |
| පරිපාලන වේතන | රු. 11,600 |
| මුදල් ශේෂය | රු. 21,300 |
| යන්ත්‍ර (පිරිවැයට) | රු. 500,000 |
| යන්ත්‍ර ක්ෂය වෙන්කිරීම | රු. 100,000 |
| විකුණුම් | රු. 118,000 |

**අතිරේක තොරතුරු :**

1. යන්ත්‍ර 10% සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.
2. 2018.12.31 තොගය රු. 20,700
3. 2018 වර්ෂයේ විදුලි බිල රු. 19,000

33. මෙම ව්‍යාපාරයේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය වනුයේ,
01. රු. 100,700 02. රු. 80,000 03. රු. 16,900 04. රු. 38,000

34. මෙම ව්‍යාපාරයේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය වනුයේ,
01. රු. 38,000 02. රු. 80,000 03. රු. 76,200 04. රු. 16,900

35. මෙම ව්‍යාපාරයේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂයේ පරිපාලන වියදම් වල එකතුව වනුයේ,
01. රු. 30,600 02. රු. 83,500 03. රු. 80,600 04. රු. 33,500

36. මෙම ව්‍යාපාරයේ 2018.12.31 දිනට අයිතිකරුගේ හිමිකම වනුයේ,
01. රු. 150,000 02. රු. 192,600 03. රු. 188,000 04. රු. 107,400

37. මෙම ව්‍යාපාරයේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී මුදලින් ගෙවා ඇති විදුලිය වන්නේ,
01. රු. 4,500 02. රු. 14,500 03. රු. 19,000 04. රු. 21,000

38. මෙම ව්‍යාපාරයේ 2018.12.31 දිනට යන්ත්‍ර වල ධාරණ අගය කීයද ?
01. රු. 350,000 02. රු. 500,000 03. රු. 400,000 04. රු. 150,000

39. මෙම ව්‍යාපාරයේ 2018.12.31 දිනට ශුද්ධ මුළු වත්කම් කීයද?
01. රු. 350,000 02. රු. 380,400 03. රු. 30,400 04. රු. 401,100

40. මෙම ව්‍යාපාරයේ පරිපාලන වියදම් වනුයේ,
01. විදුලිය, පරිපාලන වේතන, යන්ත්‍ර ක්ෂය
02. විදුලිය, බැංකු අයිරාව, පරිපාලන වේතන
03. බැංකු අයිරාව, යන්ත්‍ර ක්ෂය, පරිපාලන වේතන
04. යන්ත්‍ර ක්ෂය, විදුලිය, ණයගැතියෝ

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර
විසින් සම්පාදිත යි.